## ප්‍රධාන නීතිරීතිවල සාරාංශය - HSBC ජාත්‍යන්තර සේවා

| කෙටි විස්තර | | |
|---|---|---|
| සැලසුමෙහි විශේෂාංග | | වැඩි විස්තර සඳහා |
| සැලසුමෙහි විශේෂාංග | විදේශගත වීම<br>• ඔබ විදේශගත වීමට අදහස් කරන්නේ නම්, ඔබට සහය පිණිස අතදීමට සූදානම් ය.<br>• ප්‍රවාසිකයකු ලෙස විදේශගත වී ජීවත්වීම.<br>• ඔබ ජාත්‍යන්තරව සිතන්නේ නම්, අනෙකුත් වෙළඳපොළ අතර, HSBC ජාත්‍යන්තර සේවා ගැන වැඩි විස්තර සොයා දැනගන්න.<br>නිවස හා සම්බන්ධතාව පවත්වාගෙන සිටින්න<br>• ශ්‍රී ලංකාව වෙත නැවත පැමිණීම හෝ රැකියාව පිණිස නව ස්ථානයක පදිංචියට යාම.<br>• ගාස්තු රහිත ජාත්‍යන්තර මුදල් පැවරුම් සමගින් මුදල් යැවීම.<br>වඩා හොඳ හෙට දිනයක් වෙනුවෙන් නුවණැති තීරණයක්<br>• HSBC හි ගෝලීය බැංකුකරණ ජාලය හරහා ජාත්‍යන්තර වශයෙන් ආයෝජනය කිරීමේ දි ඔබ සහ ඔබේ පවුලේ අය වෙනුවෙන් ආරක්ෂිත දැළක් නිර්මාණය කරගන්න.<br>ඔබේ දරුවාගේ අනාගත අපේක්ෂා සඳහා සහය දීම<br>• වැඩිදුර අධ්‍යාපනය සඳහා විදේශගත වීමේදී ඔබේ දරුවා යන්නට කැමැති තැන තීරණය කිරීමට හෝ, ඔවුන්ගේ විදේශීය අධ්‍යාපනය පිළිබඳව දැනුවත් තීරණයක් ගැනීමට . | • HSBC Premier පිළිගැනීමේ පැකේජය හෝ HSBC Advance පිළිගැනීමේ පැකේජය**<br>• බැංකුවේ ගාස්තු අයක්‍රම ලේඛනය |
| ගිණුම් විශේෂාංග | • ජාත්‍යන්තර ගිණුම් වලට, එක් තනි ගිණුම් අංකයක් යටතේ පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකා රුපියල් (LKR)/විදේශ ව්‍යවහාර මුදල් (FCY) ඉතුරුම්, කාල තැන්පතු ගිණුම්, අන්තර්නම්‍ය ආයෝජන ගිණුම් (IIA) ඇතුළත් වේ.<br>• HSBC Premier හෝ HSBC Advance සහ HSBC හි ඔබ විසින් පවත්වාගෙන යනු ලබන අනෙකුත් ගිණුම් සඳහා වන ඒකාබද්ධ ප්‍රකාශනයෙහි ඔබගේ මූල්‍ය ක්‍රියාකාරකම් සියල්ල කැටි කර දක්වනු ලැබේ.<br>• සන්නාමය සහිත HSBC Premier/HSBC Advance ඩෙබිට් කාඩ්පත<br>• HSBC ඔන්ලයින් බැංකුකරණය වෙත ප්‍රවේශය<br>• SMS සංඥා | |
| ප්‍රතිලාභ | විදේශයක ගිණුම් විවෘත කිරීම්<br>• ඔබේ ගමනාන්ත රටෙහි අපගේ බැංකුකරණ සේවා වේ නම්, ඔබ විදේශගත වීමට ප්‍රථම, පිටවීමට-පෙර ගිණුමක් (Pre-departure account) විවෘත කිරීම | |

| | | |
|---|---|---|
| | **Global view සහ  Global transfers**<br>• Global view හරහා ගිණුම් දැක-බලා ගැනීම සහ ලොව පුරා ඔබ සතු HSBC Premier ගිණුම් අතර මුදල් පැවරීම ගාස්තු-රහිතව සහ එසැණින්.<br><br>ඔබේ ණයවර ඉතිහාසය පවරන්න<br>• ඔබේ ගමනාන්ත රට/කලාපය තුළ ඔබේ ණයවර ස්ථාවරත්වය ඇති කරගෙන, විදේශගත වූ සැණින් වැඩ අරඹන්න.<br><br>**Premier in one, Premier in all**<br>• ඔබ  Premier ගනුදෙනුකරුවකු නම්, ඔබේ ගමනාන්ත රට/කලාපය තුළ දී ද එම තත්ත්වයම භුක්ති විඳින්න. | |
| අවශ්‍ය ලේඛන | විදේශගත වීම<br>• අනන්‍යතාව සනාථ කිරීමේ ලේඛනයක් (උදා: විදේශ ගමන් බලපත්‍රය)<br>• ලිපිනය සනාථ කිරීමේ ලේඛනයක්<br>• ආදායම සනාථ කිරීමේ ලේඛන<br>• ජාත්‍යන්තර ගිණුමක් විවෘත කිරීමට සුදුසුකම් ඇති බව සනාථ කෙරෙන ලේඛන (ස්ථිර නේවාසික වීසා බලපත්‍රය, රැකියා අවසරපත, ශිෂ්‍ය වීසා බලපත්‍රය, ද්විත්ව පුරවැසිභාව සහතිකය ආදිය)<br>• වෙනත් අතිරේක ලේඛන සුදුසුකම්, තත්ත්වය, ඔබ තෝරාගත් ගමනාන්ත රට තු බලපවත්නා දේශීය නීතිරීති සහ රෙගුලාසි වලට විෂය වේ.<br><br>ශ්‍රී ලංකාවට මුදල් යැවීම<br>• අනන්‍යතාව සනාථ කිරීමේ ලේඛනයක් (උදා: විදේශ ගමන් බලපත්‍රය)<br>• ලිපිනය සනාථ කිරීමේ ලේඛනයක්<br>• ආදායම සනාථ කිරීමේ ලේඛන<br>• වෙනත් අතිරේක ලේඛන සුදුසුකම්, තත්ත්වය, ඔබ තෝරාගත් ගමනාන්ත රට තු බලපවත්නා දේශීය නීතිරීති සහ රෙගුලාසි වලට විෂය වේ. | ජාත්‍යන්තර බැංකුකරණ මධ්‍යස්ථානය හා සම්බන්ධ වන්න** |
| යෝග්‍යතා උපමානයන් | සුදුසුකම් ලැබීම සඳහා ඔබ පහත දෙක අතරින් එකකට අයත් විය යුතු වේ;<br>**HSBC Premier**<br>• රු. මිලියන 10ක සමස්ත සබඳතා ශේෂයක් පවත්වා ගන්න.<br>• Premier සඳහා වන සමස්ත සබඳතා ශේෂය ජංගම/ඉතුරුම්/කාල තැන්පතු ගිණුම් මගින් පවත්වාගෙන යා හැකිය.  මෙම ශේෂය රුපියල් වලින් හෝ රුපියල් වටිනාකමට සමාන වටිනාකමකින් විදේශ ව්‍යවහාර මුදලින් හෝ රුපියල් සහ විදේශ ව්‍යවහාර මුදල් යන දෙකෙහි සංයෝගයක් ලෙස හෝ පවත්වාගත හැකිය.<br>නැතිනම්,<br>**HSBC Advance**<br>• රු. මිලියන 1ක සමස්ත සබඳතා ශේෂයක් පවත්වා ගන්න, හෝ<br>• රු.150,000 හෝ ඊට වැඩි මාසික වැටුපක් ප්‍රේෂණය කරන්න<br>• Advance සඳහා වන සමස්ත සබඳතා ශේෂය ජංගම/ඉතුරුම්/කාල තැන්පතු ගිණුම් මගින් පවත්වාගෙන යා හැකිය.  මෙම ශේෂය රුපියල් වලින් හෝ රුපියල් වටිනාකමට සමාන වටිනාකමකින් විදේශ ව්‍යවහාර මුදලින් හෝ රුපියල් සහ විදේශ ව්‍යවහාර මුදල් යන දෙකෙහි සංයෝගයක් ලෙස හෝ පවත්වාගත හැකිය. | • HSBC Premier පිළිගැනීමේ පැකේජය හෝ  HSBC Advance පිළිගැනීමේ පැකේජය<br>• බැංකුවේ ගාස්තු අයක්‍රම ලේඛනය** |

| මූලාකරණ | | වැඩි විස්තර සඳහා |
|---|---|---|
| සේවා ගාස්තු | • ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර බැංකුකරණ මධ්‍යස්ථානය (IBC) හරහා ජාත්‍යන්තර ගිණුම් විවෘත කිරීම සඳහා සේවා ගාස්තු<br>- Premier ගනුදෙනුකරුවන් - නොමිලේ<br>- Premier-නොවන ගනුදෙනුකරුවන් - ගාස්තු අදාළ වේ | • ජාත්‍යන්තර බැංකුකරණ මධ්‍යස්ථානය හා සම්බන්ධ වන්න**<br>• HSBC වෙබ්අඩවිය**<br>• බැංකුවේ ගාස්තු අයකුම ලේඛනය** |
| ATM වෙතින් මුදල් ආපසු ගැනීම් සඳහා ගාස්තු | • ගනුදෙනු ගාස්තුවක් අය නොකෙරෙන[1] HSBC සමූහයේ ATM ජාලය[2] භාවිතයෙන් HSBC Premier ATM කාඩ්පත මගින් මුදල් ආපසු ගැනීම් සිදු කළ හැකියි.<br>• HSBC Premier සහ HSBC Advance සැලසුම් උපමානයන් අදාළ වේ. | |
| වෙනත් ගාස්තු | • ගෝලීය මුදල් පැවරුම් සහ හදිසියේ මුදල් බවට හැරවීමේ සේවා සඳහා වන ගාස්තු අය නොකෙරෙයි.<br>• තෝරාගත් බැංකුකරණ සේවාවන් සඳහා ගාස්තු අය නොකිරීම් හා අනුග්‍රහපූර්වක පිරිනැමීම් රැසක්. ගාස්තු සහ අය කිරීම් පිළිබඳ විස්තර සඳහා කරුණාකර HSBC වෙබ්අඩවියෙන් හෝ වෙනත් ඕනෑම HSBC ශාඛාවක දී 'HSBC පාරිභෝගික බැංකුකරණ සහ වත්කම් කළමනාකරණ ගනුදෙනුකරුවන් සඳහා වන බැංකුකරණ ගාස්තු අයකුම ලේඛනය' බලන්න. | |

[1] විදේශයක අදාළ රටෙහි බැංකු ගාස්තු අය කෙරෙනු ඇත (අදාළ වේ නම්)

[2] ආර්ජන්ටිනාව, බ්‍රසීලය, ප්‍රංශය, ග්‍රීසිය, මෝල්ටාව, මැක්සිකෝව, නවසීලන්තය සහ තුර්කිය යන රටවල ඇති HSBC ATM යන්ත්‍ර හැර, ලොව පුරා ඇති අනෙකුත් HSBC ATM යන්ත්‍රවලට UnionPay ATM chip card මගින් ප්‍රවේශවීමේ හැකියාව ඇත.

| කෙටි විස්තර | | |
|---|---|---|
| ප්‍රධාන නීතිරීති | | වැඩි විස්තර සඳහා |
| **HSBC Premier සඳහා සුදුසුකම් ලැබීම** | • HSBC Premier විශේෂාංග සහ ප්‍රතිලාභ භුක්ති විඳීමට, HSBC Premier සඳහා වන යෝග්‍යතා උපමානයන් සහ වෙනත් අදාළ නීතිරීති සහ කොන්දේසි ඔබ විසින් සපුරාලිය යුතු වේ. | නීතිරීති සහ කොන්දේසි ** |
| **HSBC Advance සඳහා සුදුසුකම් ලැබීම** | • HSBC Advance විශේෂාංග සහ ප්‍රතිලාභ භුක්ති විඳීමට, HSBC Advance සඳහා වන යෝග්‍යතා උපමානයන් සහ වෙනත් අදාළ නීතිරීති සහ කොන්දේසි ඔබ විසින් සපුරාලිය යුතු වේ. | තනි සැලසුම් පිළිබඳ විස්තර පත්‍රිකා |
| හවුල් ගිණුම් | • තනි සැලසුම් සඳහා වන නීතිරීති සහ කොන්දේසි යටතේ අදාළ ගිණුම, සේවා හෝ අන් ආකාරයේ බැඳීම් සහ වගකීම් සම්බන්ධයෙන් හවුල් ගිණුම් හිමියන් එකිනෙකා ද සමග එක්ව හා වෙන් වෙන්ව ඔබ සියලුදෙනාම බැඳී සිටියි. | |
| ගාස්තු | • අදාළ අවස්ථාවන් හි දී කලින් කලට සේවා ගාස්තු, පහසුකම් ගාස්තු හෝ වෙනත් ගාස්තු පනවනු ඇත. ගාස්තු සහ අයකිරීම්, "HSBC පාරිභෝගික සහ වත්කම් කළමනාකරණ ගනුදෙනුකරුවන් සඳහා වන බැංකුකරණ ගාස්තු අයක්‍රම ලේඛනය" මගින් ප්‍රකාශයට පත් කරනු ලබන අතර, HSBC Premier වෙබ්අඩවියෙන් හෝ ඕනෑම HSBC ශාඛාවකින් ද ලබාගත හැකිය. | |
| ඔබේ තොරතුරු භාවිතය | • HSBC හෝ HSBC සමූහයෙහි වෙනත් සාමාජිකයන් ගනුදෙනුකරුගේ තොරතුරු (ගනුදෙනුකරු, ගනුදෙනුකරුගේ ගනුදෙනු, වැඩි ඉල්ලුමක් ඇති (FMC) සැලසුම් හා සේවාවන් ගනුදෙනුකරු විසින් භාවිතය සහ HSBC සමූහය සමග ගනුදෙනුකරුගේ සම්බන්ධය පිළිබඳ අදාළ තොරතුරු ද ඇතුළත්ව) එකතු කිරීම, භාවිතය හා හුවමාරු කරගැනීම සිදු කළ හැකිය. ගනුදෙනුකරු (හෝ ගනුදෙනුකරු වෙනුවට කටයුතු කරන අයෙකු) වෙතින්, නැතහොත් වෙනත් මූලාශ්‍රයකින් (පොදුවේ ලබාගත හැකි තොරතුරු ද ඇතුළත්ව HSBC හෝ HSBC සමූහයේ සාමාජිකයකු විසින් හෝ ඒ වෙනුවෙන් ගනුදෙනුකරුගේ තොරතුරු ඉල්ලා සිටිය හැකිය. | |
| ඔබේ ගිණුම්වලට හර කිරීමට; හිලව් කිරීමට අපට ඇති අයිතිය | ඔබ වෙත පූර්ව-දැනුම්දීමකින් තොරව පහත සඳහන් කටයුතු සිදු කිරීමට අපට අයිතිය ඇත:<br>• ඔබ විසින් අප වෙත ගෙවිය යුතුව ඇති ඕනෑම මුදලක් අප සමග ඔබ විසින් පවත්වාගෙන යනු ලබන ඕනෑම ගිණුමකින් හර කිරීමට;<br>• ඔබ විසින් අප සමග පවත්වාගෙන යනු ලබන ඔබගේ කිසියම් හෝ සියලුම හෝ ගිණුම්වල ශේෂයන් රඳවා ගැනීමට, සංයුක්ත කිරීමට, හෝ ඒකාබද්ධ කිරීමට සහ අප වෙත ගෙවීමට ඇති එවැනි ඕනෑම ගිණුමක් බැරට ඇති ඕනෑම මුදලක් සත්‍ය හෝ අභඹු වුවද, වර්තමාන හෝ අනාගතයේ ඔබ විසින් ගෙවිය යුතු වුවද, (සහ ඔබ විසින් තනිව හෝ වෙනත් ඕනෑම අයෙකු සමග හවුල් ව වුවත්) හිලව් කිරීමට සහ මාරු කිරීමට; සහ<br>• ඔබ වෙත අප විසින් ගෙවිය යුතුව ඇති මුදලට වඩා ඔබ විසින් අප වෙත ගෙවිය යුතුව ඇති කිසියම් මුදලක වටිනාකම වැඩි වූ අවස්ථාවක, අප සමග පවත්වාගෙන යන ඔබගේ කිසියම් හෝ ඕනෑම හෝ ගිණුමක ඕනෑම ව්‍යවහාර මුදල් වර්ගයකින් බැරට ඇති ඕනෑම මුදලක් ඔබ වෙත ගෙවිය යුතු හෝ ඔබ විසින් ඉල්ලා සිටි අවස්ථාවක දී හෝ ඔබ වෙත ආපසු ගෙවීම ප්‍රතික්ෂේප කිරීමට. | |

| | | |
|---|---|---|
| සේවා හෝ ගිණුම් අවසන් කිරීම | • පූර්ව ලිඛිත දැනුම්දීමක් මගින් අපගේ සේවාවන් හෝ ඔබේ ඕනෑම ගිණුමක් හෝ ඔබට අවසන් කළ හැකිය.<br>• ඔබ වෙත සපයන අපගේ සේවාවන් සම්පූර්ණයෙන් හෝ එම සේවාවන්ගෙන් ඕනෑම කොටසක් හෝ කිසිදු පූර්ව දැනුම්දීමකින් තොරව අත්හිටුවීම හෝ නීතිරීති සහ කොන්දේසිවල අන්‍යාකාරයකින් විශේෂිතව දක්වා නොමැති නම්, හේතු දක්වා හෝ නොදක්වා ඔබගේ ඕනෑම ගිණුමක් පූර්ව-දැනුම්දීමක් සහිතව අප විසින් අත්හිටුවීම සිදු කළ හැකිය. | |
| නීතිරීති සහ කොන්දේසි වෙනස් කිරීම | • අපගේ පරිශ්‍රයන් හි, පොදු වෙබ්අඩවියෙහි හෝ අප විසින් සුදුසු යැයි තීරණය කරන ඕනෑම ආකාරයක් මගින් ඔබ වෙත දැනුම්දීම හරහා නීතිරීති සහ කොන්දේසි කලින් කලට වෙනස් කිරීම සඳහා වූ අයිතිය අප සතු වේ. | |

## ඔබේ හඬ

ඔබේ අදහස් අප වෙත දැන්වීමට කැමැති නම්, කරුණාකර අප අමතන්න.

තැපැල් ලිපිනය - කළමනාකරු පාරිභෝගික සේවා, පාරිභෝගික බෙදාහැරීම් සහ වත්කම් කළමනාකරණය, HSBC මධ්‍යස්ථානය, අංක 163, යුනියන් පෙදෙස, කොළඹ 2.

පාරිභෝගික විසඳුම් ක්ෂණික ඇමතුම්: +94 114 511 566
විද්‍යුත් තැපැල්: customersolutions@hsbc.com.lk
වෙබ්අඩවිය: www.hsbc.lk

අප වෙත මතු කරන ඕනෑම කරුණක් ඔබ සම්පූර්ණයෙන්ම සතුටට පත්වන ආකාරයට විසඳීමට අප කැමැති වන අතරම, ඔබට මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයාගේ කාර්යාලය වෙත ලිපියක් ලියා ප්‍රතිකර්මයක් ඉල්ලා සිටිය හැකිය. ඔම්බුඩ්ස්මන්වරයාගේ ඇමතුම් තොරතුරු පහත දැක්වේ.

තැපැල් ලිපිනය - ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයාගේ කාර්යාලය, අංක 143A, වජිර පාර, කොළඹ 04.
ෆැක්ස්: +94 112 595 624

විද්‍යුත් තැපැල්: infor@financialombudsman.lk
වෙබ්අඩවිය: www.financialombudsman.lk

වැඩි විස්තර සඳහා කරුණාකර අපගේ වෙබ්අඩවිය වන www.hsbc.lk වෙත පිවිසෙන්න.

*සම්පූර්ණ සංකලිත ගිණුම් සඳහා වන නීතිරීති සහ කොන්දේසි සංකලිත ගිණුම් සඳහා අදාළ වේ. දැනගැනීම සඳහා පමණක් වන මූලික සැලසුම්වලට අදාළ නීතිරීතිවල සාරාංශයක් මෙම වගුවෙහි අඩංගු වන අතර, සම්පූර්ණ නීතිරීති සහ කොන්දේසි වෙනුවට එය අදාළ කරගත නොහැක. යම්කිසි අනනුකූලතාවක දී සම්පූර්ණ නීතිරීති සහ කොන්දේසි බලපැවැත්වෙනු ඇත.

| ** වැඩි විස්තර සඳහා | |
|---|---|
| බැංකුවේ ගාස්තු අයකිරීම් ලේඛනය | Tariffs \| Interest and Foreign Exchange Rates - HSBC LK |
| සැලසුම් සඳහා වන නීතිරීති සහ කොන්දේසි | Terms and Conditions \| Help and Support Center - HSBC LK |
| ජාත්‍යන්තර බැංකුකරණ මධ්‍යස්ථානය | විද්‍යුත් තැපැල : www.internationalbanking@hsbc.com.lk \| www.internationalservices@hsbc.com.lk<br>දුරකථන : +94 11 464 1888 (සතියේ දිනවල පෙ.ව. 9 සිට ප.ව. 5 දක්වා)<br>වෙබ්අඩවිය : www.hsbc.lk/international |
| HSBC වෙබ්අඩවිය | www.hsbc.lk |